**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**සිංහල භාෂාව හා සාහිත්‍ය තරඟාවලිය - 2024**

**(කලාප මට්ටමේ ලිඛිත තරඟ)**

1. අපේක්ෂකයාගේ නම : ..............................................................................
   (මුල'කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ..............................................................................
3. පාසල් වර්ගය (200 තෙක් / 201 - 500 තෙක් / 500 ට වැඩි) ..............................
4. කලාපය : ..............................................
5. පළාත : ..............................................

| 6 ශ්‍රේණිය | සාහිත්‍ය දැනුම මිනුම | කාලය පැය 02 |
|---|---|---|

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(01) පෙළපොත ඇසුරෙන් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| ප්‍රකාශය | ප්‍රකාශය ඇතුළත් පාඩම | කවුරුන් විසින් කියන ලද්දක් ද? | කා හට කියන ලද්දක් ද? |
|---|---|---|---|
| (i) "ගොහින් බලාපල්ලා මගේ වී ගොඩ" | | | |
| (ii) "ස්වාමීනී, අපි ඉඳිකටු කුළා නිසා බටදඬු ගෙන්වුම්හ. ඒ බට දඬු මුල පටන් අග දක්වා දිගට ම සිදුරු ය." | | | |
| (iii) "මම මේ හත් අවුරුදු නියඟයකට අහුවෙලා වේළිලා , වේළිලා කොට්ට වෙලා" | | | |
| (iv) "හොඳ සිහියෙන් සිටි විටෙකැ වත් එය ගණන් කිරීම නොහැකි යැ" | | | |
| (v) "දැන් ඉතින් ඔහොම කනගාටුවෙන් ඉන්න එපා. මොකක් ද ඉතින් කනගාටුවෙන් ඉන්න තියෙන හේතුව " | | | |

(ලකුණු 3 × 5 = 15)

(02) පෙළ පොතෙන් උපුටා ගත් පහත සඳහන් පද්‍ය සම්පූර්ණ කරන්න.

1. උදැල්ල හා කැත්ත කරේ තබා ලා
   සැහැල්ලුවෙන් බෝම දෙපා නගා ලා
   ..............................................................................
   ..............................................................................

2. නමින් පට බැන්දත්
   රනින් රුවනින් දිලුණත්
   ..............................................................................
   ..............................................................................

3. දත් කැකුළු පෑ ලා
සුරතල් සිනා සී ලා

---------------------------------------------------------------

---------------------------------------------------------------

4. අනුන්ට බුහුමන් දී සලකන්නේ
තමන්ට බුහුමන් ලැබෙයි එයින්නේ

---------------------------------------------------------------

---------------------------------------------------------------

5. නිකම් ඉදීමෙන් පල නෑ ගෙ මුල්ලේ
තමන් තමන්ගේ වැඩෙහී යෙදෙත්වා

---------------------------------------------------------------

---------------------------------------------------------------

(ලකුණු 2 × 5 = 10)

(03) පහත සඳහන් ප්‍රකාශවල හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i) 'අපේ ගම' නම් කෘතිය රචනා කළේ ..................................................................මහතා ය.

(ii) සිංහල කාව්‍ය ක්ෂේත්‍රය පෝෂණය කළ ඇස්. මහින්ද හිමි........................................... උපත ලබා ඇත.

(iii) 'දඹානේ වැදිබස' නම් කෘතිය..........................................වර්ෂයේ දී රචනා විය.

(iv) 'ගුත්තිල කාව්‍යය' රචනය සඳහා .............................................................. පාදක විය.

(v) 'බ්‍රොහියර් දුටු ලංකාව' නම් කෘතිය පරිවර්තනය කළේ .........................................මහතා ය.

(ලකුණු 2 × 5 = 10)

(04) පහත 'A' කොටසට ගැළපෙන පිළිතුර 'B' කොටසින් තෝරා යා කරන්න.

| | 'A' කොටස | 'B' කොටස |
|---|---|---|
| (i) | මැකී ගිය දඩමං | සිංහල ජනකතා සංග්‍රහයකි. |
| (ii) | සකස්කඩ | පරිවර්තන කෘතියකි. |
| (iii) | වටු කිරිල්ලී සහ තවත් කතා | ඉංග්‍රීසි නවකතාවකි. |
| (iv) | මාස්ටර්මන් රෙඩී | වේදිකා නාට්‍යයකි. |
| (v) | නරිබෑනා | සංස්කෘත මිශ්‍ර භාෂාවෙන් රචිත බුද්ධ චරිතයකි. |

(ලකුණු 2 × 5 = 10)

(05) පහත සඳහන් ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

(i) 'මග දිගට ජන කතා' කෘතිය මහනුවර ප්‍රදේශයේ ප්‍රචලිත පුරාවෘත්ත හා ජනකතා සංග්‍රහයකි. ( )

(ii) 'මගුල් කෑම' මාර්ටින් වික්‍රමසිංහයන් විසින් රචිත කෘතියකි. ( )

(iii) පන්සියපනස් ජාතක පොතෙහි ජාතක කථා 547 ක් අඩංගු වේ. ( )

(iv) සිංහල භාෂාවෙන් ලියැවුණු පැරණි ම සිංහල කාව්‍ය නිර්මාණ අපට හමුවන්නේ සීගිරි කැටපත් පවුරිනි. ( )

(v) සාහිත්‍ය නිර්මාණවල එක ම ශබ්දය නැවත නැවත යෙදීම එළිසමය වේ. ( )

(ලකුණු 1 × 5 = 5)

(06) පහත සඳහන් ගද්‍ය, පද්‍ය පාඨවල දක්වෙන උපමාව සහ උපමේය වෙන් කර ලියන්න.

(i) කොස් ගෙඩිය කැපූ කල තාර මෙන් ඝන වූ, එහෙත් වර්ණයෙන් සුදු වූ දියරයක්, මැලියමක් ගලයි.

(ii) කිළුටු වැරහැලි ඇඳගෙන - පඹයෙකුගේ විලසින

(iii) සබන් පෙණ වැනි පෙණ බුබුළු එයින් මතු වන්නට විය.

(iv) ඇඹුල් දණ්ඩෙන් පැන් බොන්නවුන් මෙන් තාගේ පොකුණෙන් පැන් බොමිහ.

(v) වැළ මොළොක් ය, දෙදොල් බඳු ය.

| | උපමාව | උපමේය |
|---|---|---|
| (i) | ------------------------------------ | ------------------------------------ |
| (ii) | ------------------------------------ | ------------------------------------ |
| (iii) | ------------------------------------ | ------------------------------------ |
| (iv) | ------------------------------------ | ------------------------------------ |
| (v) | ------------------------------------ | ------------------------------------ |

(ලකුණු 2 × 5 = 10)

(07) පහත සඳහන් පදවල අර්ථය ලියන්න.

(i) මූකලන් කැලේ ---------------------- (ii) කුඩ මස්සන් ----------------------

(iii) ලෝක ස්වාමී ---------------------- (iv) පිවිතුරු ----------------------

(v) පුෂ්පකරණීහු ---------------------- (vi) ප්‍රණීත ----------------------

(vii) දුර්ලභ ---------------------- (viii) ප්‍රතිඥාව ----------------------

(ix) සමකාලීන ---------------------- (x) දකුම්කලු ----------------------

(ලකුණු 2 × 5 = 10)

(08) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) වැදි ජනයා පිළිබඳ පර්යේෂණ ග්‍රන්ථ ලියූ දේශීය විද්වතුන් දෙදෙනෙකු නම් කරන්න.

1) ---------------------------------- 2)----------------------------------

(ii) කුමාරතුංග මුනිදාසයන් විසින් රචිත ළමා කෘති දෙකක් නම් කරන්න.

1) ---------------------------------- 2)----------------------------------

(iii) 'ගුත්තිල කාව්‍යය' සහ 'වවුලුව' පද්‍ය කෘති රචකයින් නම් කරන්න.

1) ---------------------------------- 2)----------------------------------

(iv) කේ. ජයතිලක මහතා අයත් යුගය සහ එතුමාගේ ස්වයං චරිතාපදාන කෘතිය නම් කරන්න.

1) ---------------------------------- 2)----------------------------------

(v) ජනශ්‍රැති ලක්ෂණ දෙකක් නම් කරන්න.

1) ---------------------------------- 2)----------------------------------

(ලකුණු 2 × 5 = 10)

(09) පහත සඳහන් ගද්‍ය, පද්‍ය පාඨවල අර්ථය ලිහිල් බසින් ලියන්න.

(i) අපි හැම අසූ දහසක් පමණ වඳුරෝ පොකුණට නොබැස ම එකී එකී බට දණ්ඩක් ගෙන ඇඹුල් දණ්ඩෙන් පැන් බොන්නවුන් මෙන් තාගේ පොකුණෙන් පැන් බොම්හ.

---------------------------------------------------------------------------

---------------------------------------------------------------------------

---------------------------------------------------------------------------

---------------------------------------------------------------------------

(ii) පිපේ නෙලුම් ඕලු ගගේ විලේ ඇලේ
තිබේ වලාකුළු පහ වී නිලේ වෙලේ
නො පේන තෙක් ඈත මඟුල් ගෙයක් වගේ
සැදී සිටින්නේ ද ගසුත් වැලුත් ගලුත්

---------------------------------------------------------------------------

---------------------------------------------------------------------------

---------------------------------------------------------------------------

---------------------------------------------------------------------------

(ලකුණු 5 × 2 = 10)

(10) පහත සඳහන් පැදිපෙළ කියවා එහි ඇතුළත් අදහස ගැන සැලකිල්ල යොමු කර, ඒ පිළිබඳ ව ඔබගේ සිතට නැගෙන හැඟීම් **වාක්‍ය පහකින්** ලියන්න.

කහ පාටට දිලිසි දිලිසි
රෑ අහසේ මල් ඉසිරේ
සඳ කුමරුගෙ තනි මකන්න
තරුවෙන් ගීයක් මිමිනේ

උදෑසනට හිරු නැග ඒ
මී මැස්සා රැගුම් රගේ
මල් පිපිලා ලොව සැරසේ
කුරුල්ලෝ පෙම් ගී මිමිනේ

හඳ මාමා හෙමින් නැගේ
තරු අතරින් එබී බැලේ
රෑ අහසේ තනි නැති වේ
එහෙත් අනේ තරු නොනැගේ

(i) ---------------------------------------------------------------

(ii) ---------------------------------------------------------------

(iii) ---------------------------------------------------------------

(iv) ---------------------------------------------------------------

(v) ---------------------------------------------------------------

(ලකුණු 10)

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**සිංහල භාෂාව හා සාහිත්‍ය තරඟාවලිය - 2024**
**(කලාප මට්ටමේ ලිඛිත තරඟ)**

1. අපේක්ෂකයාගේ නම : ..............................................................................
   (මුල්'කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ..............................................................................
3. පාසල් වර්ගය (200 තෙක් / 201 - 500 තෙක් / 500 ට වැඩි) ..............................
4. කලාපය : ..............................
5. පළාත : ..............................

**7 ශ්‍රේණිය** | **සාහිත්‍ය දැනුම මිනුම** | **කාලය පැය 02**

සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

(01) පෙළපොත ඇසුරෙන් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| ප්‍රකාශය | ප්‍රකාශය ඇතුළත් පාඩම | කවුරුන් විසින් කියන ලද්දක් ද? | කා හට කියන ලද්දක් ද? |
|---|---|---|---|
| ( i) "ඇයි, ඉතින් ගැලවෙන විදිහක් ඔබ ම කල්පනා නොකරන්නේ?" | | | |
| (ii) "පාවර ආරක්ෂා කරන්නටයි මේ සිරිත් කරන්නේ. දූන් වෙලාව හරි" | | | |
| (iii) "එවිට යම් කෙනෙක් මරා දමා පූ නම් මේ රාජ්‍යශ්‍රීය ලබන්නට නැත්තේ වේ ද" | | | |
| (iv) "ඒ කටයුතු අහවර වුණා ම ආවාස ගෙට ඇවිත් මාව බැහැදකින්ඩ කියනවා හොඳයි" | | | |
| (v) "මේ වගේ සෙනග පිරිලා ඉන්න තැන්වලට ආවා ම අපිටත් ඔහොම වෙයි ද දන්නෑ " | | | |

(ලකුණු 3 × 5 = 15)

(02) පෙළ පොතෙන් උපුටා ගත් පහත සඳහන් පද්‍ය සම්පූර්ණ කරන්න.

1. මා වැනි බිලින් දා
   වර වර ළඟට කැන්දා
   ..............................................................................
   ..............................................................................

2. ..............................................................................
   ..............................................................................
   කොළ මඩවන වේලාවයි
   කමත පිරෙන වේලාවයි

3. බැස යන ගඟුලැල් පුරා
පෙණ පිඬුවල සැරි සරා

-----------------------------------------------------------

-----------------------------------------------------------

4. සමන් පිච්ච මල් ඉහිරුණු

-----------------------------------------------------------

වගෙයි අහස අන්න බලනු

-----------------------------------------------------------

5. නිල් රෙද්දක රන් තැටියක්
හංගන හැටි මෙන්න කියා

-----------------------------------------------------------

-----------------------------------------------------------

(ලකුණු 2 × 5 = 10)

(03) පහත ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

අ) ගස වතුසුදු
වී පිරිසිදු
පොහොය නැතිදු
සිල්ගත් බඳු

ඉහත පද්‍යයේ රචකයා කවරෙක් ද?

(i) අරිසෙන් අහුබුදු (ii) මුනිදාස කුමාරතුංග
(iii) ආනන්ද රාජකරුණා (iv) ඇස්. මහින්ද හිමි

ආ) සිංහලයෙහි හමුවන උපදේශ කාව්‍ය ග්‍රන්ථයක් නොවන්නේ මින් කුමක් ද?

(i) ලෝවැඩ සඟරාව (ii) සුභාෂිතය
(iii) සමන් සිරිත (iv) ලෝකෝපකාරය

ඉ) 'ගොවි බිරියගේ නුවණ' කුමන රටක ජනකතාවක් ද?

(i) පකිස්ථානු (ii) ඉන්දියානු (iii) චීන (iv) ශ්‍රී ලංකා

ඊ) වැලිවිට සරණංකර සංඝරාජ හිමියන් විසින් රචිත ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථයකි.

(i) සැළලිහිණි සන්දේශය (ii) සාරාර්ථ සංග්‍රහය
(iii) බුදුගුණාලංකාරය (iv) කාව්‍යශේඛරය

උ) 'මනෝරථපූරණී' නැමති ග්‍රන්ථය කිනම් භාෂාවකින් රචිත ද?

(i) සංස්කෘත (ii) සිංහල (iii) මාගධී (iv) පාලි

(ලකුණු 2 × 5 = 10)

(04) පහත සඳහන් ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

(i) පන්සිය පනස් ජාතක පොතේ 'චම්පෙය්‍ය ජාතකය' අතීතයේ අහිකුණ්ඨික ගෝත්‍රයක් පැවති බව සාක්ෂි සපයයි. ( )

(ii) 'තිරුක්කුරල්' නමැති දෙමළ උපදේශ ග්‍රන්ථය සුභාෂිතය රචනයට බලපෑවේ ය. ( )

(iii) 'හිම කුමරිය' වේදිකා නාට්‍ය සෝමලතා සුබසිංහගේ නිර්මාණයක් නොවේ. ( )

(iv) 'මගුල් ලකුණ' අකුරු කරන්නට ම ලියැවුණු පැරණි පොතකි. ( )

(v) 'රත්නදීප ජන්ම භූමි - ලංකාදීප විජය භූමි' මහගම සේකරයන්ගේ පද්‍ය නිර්මාණයකි. ( )

(ලකුණු 1 × 5 = 5)

(05) පහත සඳහන් ගද්‍ය, පද්‍ය පාඨවල දැක්වෙන උපමාව සහ උපමේය වෙන් කර ලියන්න.

(i) මීදුම් සළුව වේදිකාවක සුදු පැහැති කඩතිරයක් මෙන්

(ii) ගස වතුසුදු - වී පිරිසිදු
පොහොය නැතිදු - සිල්ගත් බඳු

(iii) කණාමැදිරියෝ වඳුරන් පැනීමෙන් පාත් වී උස්වන අතුවල හැපී ගිනි පුපුරු හැළෙන්නාක් මෙන්

(iv) හිරු දෙසට හැරෙන සූරියකාන්ත මලක් මෙන් පොත පතට ම නැඹුරු විය

(v) මා පණ මෙන් ඔබ රකිනෙමි ලංකා

| | උපමාව | උපමේය |
|---|---|---|
| (i) | ------------------------------ | ------------------------------ |
| (ii) | ------------------------------ | ------------------------------ |
| (iii) | ------------------------------ | ------------------------------ |
| (iv) | ------------------------------ | ------------------------------ |
| (v) | ------------------------------ | ------------------------------ |

(ලකුණු 2 × 5 = 10)

(06) පහත දැක්වෙන පදවල අර්ථය ලියන්න.

(i) පුනර්ජීවය ------------------------ (ii) සිලිලාර ------------------------
(iii) අවශේෂ ------------------------ (iv) අභිප්‍රාය ------------------------
(v) වික්ෂේප ------------------------ (vi) වෘද්ධ ------------------------
(vii) කුලුණු ------------------------ (viii) සවිසත ------------------------
(ix) හෙල්මැලි ------------------------ (x) ආචාර්භාගය ------------------------

(ලකුණු 1×10 = 10)

(07) පහත සඳහන් ග්‍රන්ථ රචනා කළ ලේඛකයින් නම් කරන්න.

(i) කියවන නුවණ ------------------------
(ii) විනිවිදිමි අඳුර ------------------------
(iii) රෝහිණී ------------------------
(iv) කෝමල රේඛා ------------------------
(v) අක්කර පහ ------------------------

(ලකුණු 2×5 = 10)

(08) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) අතීතයේ අභිකුණ්ඨික නම් ගෝත්‍රයක් පැවති බව සාක්ෂි සැපයෙන කෘති 02 ක් ලියන්න.
1) ------------------------ 2) ------------------------

(ii) විනෝදාස්වාදය තේමා කරගත් ජනකවි වර්ග 02 ක් නම් කරන්න.
1) ------------------------ 2) ------------------------

(iii) පන්සිය පනස් ජාතක පොත හා සැළලිහිණි සන්දේශය රචිත යුග නම් කරන්න.
1) ------------------------ 2) ------------------------

(iv) ' ලංකා ලංකා පෙම්බර ලංකා' සහ 'රත්නදීප ජන්ම භූමි' යන දේශාභිමානී ගීත රචනා කළේ කවුරුන් විසින් ද?
1) ------------------------ 2) ------------------------

(v) සාහිත්‍ය නිර්මාණයක ශබ්ද රසය උදෙසා භාවිත කාව්‍යෝපක්‍රම 02 ක් නම් කරන්න.
1) ------------------------ 2) ------------------------

(ලකුණු 2×5 = 10)

(09) පහත සඳහන් ගද්‍ය, පද්‍ය පාඨ ලිහිල් බසින් ලියන්න.

(i) එකියන රාජ කුමාරයෝත් රාජ්‍යයට පැමිණ දිසාපාමොක් ආචාරීන්ට පාටව කරන්නා කැමැතිව ආචාරීන් වහන්සේ මා කෙරේ සැක නොසිතා වහා එන්නේ යහපතැ යි කියා යැවූහ.

------------------------------------------------------------------------

------------------------------------------------------------------------

------------------------------------------------------------------------

------------------------------------------------------------------------

(ii) ජම්බු ගහට රත පොරවන්නී
බක් මී ගහ කහ අන්දන්නී
අඹ දලු ළා රත තවරන්නී
ලෝකත විසිතුරු කරලන්නී

------------------------------------------------------------------------

------------------------------------------------------------------------

------------------------------------------------------------------------

------------------------------------------------------------------------

(ලකුණු 5 × 2 = 10)

(10) පහත සඳහන් පැදිපෙළ කියවා ඒ පිළිබඳ ව ඔබගේ සිතට නැගෙන හැඟීම් **වාක්‍ය දහයකින්** ලියන්න.

වලාකුළින් වහින වැස්ස
හෝ හෝ ගා වහින වැස්ස
ගංගාවල් හදන වැස්ස
වහිනු වහිනු වහිනු වැස්ස

සිරි සිරි පොද වැටෙන වැස්ස
ගස් වැල් පණ ගහන වැස්ස
මිදුලේ අපි තෙමෙන වැස්ස
වහිනු වහිනු වහිනු වැස්ස

මිදුල මුද කරන වැස්ස
මිදුලේ නැව් යවන වැස්ස
මල්ලිට වැඩ තියෙන වැස්ස
වහිනු වහිනු වහිනු වැස්ස

මිදුලෙ රැලෙන් නගින වැස්ස
හෙන වෙඩි පුපුරවන වැස්ස
පොඩි අපි බය කරන වැස්ස
වහිනු වහිනු වහිනු වැස්ස

(i) ------------------------------------------------------------------------

(ii) ------------------------------------------------------------------------

(iii) ------------------------------------------------------------------------

(iv) ------------------------------------------------------------------------

(v) ------------------------------------------------------------------------

(vi) ------------------------------------------------------------------------

(vii) ------------------------------------------------------------------------

(viii) ------------------------------------------------------------------------

(ix) ------------------------------------------------------------------------

(x) ------------------------------------------------------------------------

(ලකුණු 10)

(09) පහත සඳහන් ගද්‍ය, පද්‍ය පාඨ ලිහිල් බසින් ලියන්න.

(i) එකියන රාජ කුමාරයෝත් රාජ්‍යයට පැමිණ දිසාපාමොක් ආචාරීන්ට පාටව කරන්නා කැමැතිව ආචාරීන් වහන්සේ මා කෙරේ සැක නොසිතා වහා එන්නේ යහපතැ යි කියා යැවූහ.

---

---

---

---

(ii) ජම්බු ගහට රත පොරවන්නී
බක් මී ගහ කහ අන්දන්නී
අඹ දලු ළා රත තවරන්නී
ලෝකත විසිතුරු කරලන්නී

---

---

---

---

(ලකුණු 5 × 2 = 10)

(10) පහත සඳහන් පැදිපෙළ කියවා ඒ පිළිබඳ ව ඔබගේ සිතට නැගෙන හැඟීම් **වාක්‍ය දහයකින්** ලියන්න.

| | | | |
|---|---|---|---|
| වලාකුළින් වහින | වැස්ස | මිදුල මූද කරන | වැස්ස |
| හෝ හෝ ගා වහින | වැස්ස | මිදුලේ නැව් යවන | වැස්ස |
| ගංගාවල් හදන | වැස්ස | මල්ලිට වැඩ තියෙන | වැස්ස |
| වහිනු වහිනු වහිනු | වැස්ස | වහිනු වහිනු වහිනු | වැස්ස |
| සිරි සිරි පොද වැටෙන | වැස්ස | මිදුලෙ රැලෙන් නගින | වැස්ස |
| ගස් වැල් පණ ගහන | වැස්ස | හෙන වෙඩි පුපුරවන | වැස්ස |
| මිදුලේ අපි තෙමෙන | වැස්ස | පොඩි අපි බය කරන | වැස්ස |
| වහිනු වහිනු වහිනු | වැස්ස | වහිනු වහිනු වහිනු | වැස්ස |

(i) ---
(ii) ---
(iii) ---
(iv) ---
(v) ---
(vi) ---
(vii) ---
(viii) ---
(ix) ---
(x) ---

(ලකුණු 10)

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2024**
**(කලාප මට්ටමේ ලිඛිත තරග)**

1. අපේක්ෂකයාගේ නම : ------------------------------------------------
   (මුල්'කුරු සමඟ නිවැරදි ව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ------------------------------------------------
3. පාසල් වර්ගය (200 තෙක් / 201 - 500 තෙක් / 500 ට වැඩි) ----------------------
4. කලාපය : ----------------------------
5. පළාත : ----------------------------

**8 ශ්‍රේණිය** | **සාහිත්‍ය දැනුම මිනුම** | **කාලය පැය 02**

සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

(01) පෙළපොත ඇසුරෙන් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| ප්‍රකාශය | ප්‍රකාශය ඇතුළත් පාඩම | කවුරුන් විසින් කියන ලද්දක් ද? | කා හට කියන ලද්දක් ද? |
|---|---|---|---|
| (I) "මඩක්කුවෙ තිබුණෙ මං හාල් හෝදපු වතුර ටික නේ " | | | |
| (ii) "ඒක ඇත්ත. මම කැමති උඹලාගේ කටෙන් ම මේවා අහන්න." | | | |
| (iii) "වහා තාගේ කඩු හා දුහුහී බිම දමා මට නමස්කාර කරව " | | | |
| (iv) "මා ගැයූ පළමු දිනයේ දී ම ඔබේ ඇස්වල ගැලූ කඳුළු මට හොඳට මතකයි. " | | | |
| (v) "වැඩ අත් හරින වෙලාව වෙන කොට සේරම වැඩ ඉවර කර ගන්න ඕනෑ " | | | |

(ලකුණු 3 × 5 = 15)

(02) පෙළ පොතෙන් උපුටා ගෙන ඇති පහත සඳහන් පද්‍ය සම්පූර්ණ කරන්න.

1. අහසේ තරු වැල් පිරිලා
   පොළොවේ සුදු මල් පිපිලා
   ------------------------------------------------
   ------------------------------------------------

2. මං සදන්නන් ගල කඩන තැන
   ------------------------------------------------
   දූලි තැවරුණු සළු දරාගෙන
   ------------------------------------------------

3. ------------------------------------------------------------

------------------------------------------------------------

ඇගේ කම්මුල් දෙකේ පාට
කොයින් ද මේ රෝස මලට

4. ගත රැඳි දුහුවිලි රනබරණයි
දහදිය මඩ විලවුන් සුවඳයි

------------------------------------------------------------

------------------------------------------------------------

5. බඩගිනි වෙලා මා ගිය කල පුතුගෙ ගෙට

------------------------------------------------------------

------------------------------------------------------------

මැනලද පුතේ කිරි දුන්නේ මං නුඹට

(ලකුණු 2 × 5 = 10)

(03) පහත ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

අ) රබීන්ද්‍රනාත් තාගෝර්තුමාට සාහිත්‍ය පිළිබඳ නොබෙල් ත්‍යාගය හිමිවූයේ කිනම් කෘතිය සඳහා ද?

(i) ගීතාංජලී (ii) කබිකහානි
(iii) නෛවේද්‍ය (iv) සන්ධ්‍යා සංගීත්

ආ) කෝට්ටේ යුගයේ රචිත සන්දේශ කාව්‍යයක් නොවන්නේ මින් කුමක් ද?

(i) සැළලිහිණි සන්දේශය (ii) ගිරා සන්දේශය
(iii) මයුර සන්දේශය (iv) පරෙවි සන්දේශය

ඉ) 'සමන් පිච්ච මල් ඉහිරුණු - නිල් තණකොළ පිට්ටනියක්
වගෙයි අහස අන්න බලනු - කොච්චර ලස්සන ද රෑට'
යන පද්‍ය පන්තිය අයත් කාව්‍ය නිර්මාණයේ රචකයා කවු ද?

(i) කුමාරතුංග මුනිදාස (ii) අරිසෙන් අහුබුදු
(iii) රැපියෙල් තෙන්නකෝන් (iv) ඇස්.මහින්ද හිමි

ඊ) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර විසින් රචිත නාට්‍ය නිර්මාණයක් නොවන්නේ මින් කුමක් ද?

(i) මනමේ (ii) හුණුවටයේ කතාව
(iii) සිංහබාහු (iv) එලොව ගිහින් මෙලොව ආවා

උ) 'මීටර් සියය' කෙටිකතාවේ රචකයා කවරෙක් ද?

(i) මාර්ටින් වික්‍රමසිංහ (ii) ලීල් ගුණසේකර
(iii) ඒ.එච්.පියසේන (iv) කේ.ජයතිලක

(ලකුණු 2 × 5 = 10)

(04) පහත සඳහන් ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

(i) 'නරිබෑනා' වේදිකා නාට්‍යය දයානන්ද ගුණවර්ධනයන්ගේ නිර්මාණයකි. ( )
(ii) 'පියසේන' යනු 'මීටර් සියය' කෙටි කතාවේ අන්තර්ගත චරිතයකි. ( )
(iii) 'මේ අරණේ - හිමගිර සිට දෙරණේ - මාගේ සරණේ වේ' යන ගීත කණ්ඩය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ වේදිකා නාට්‍යයක කොටසකි. ( )
(iv) වීදාගම මෛත්‍රේය හිමියන් 'ගිරා සංදේශයේ' රචකයා ය. ( )
(v) විශ්ව සාහිත්‍යයේ පුරෝගාමී ලේඛකයන් අතර විලියම් ශේක්ස්පියර් අමරණීය චරිතයකි. ( )

(ලකුණු 1 × 5 = 5)

(05) පහත සඳහන් වචනවල තේරුම ලියන්න.

(i) පුරාණෝක්තීන් ______________ (ii) තෙද බල ______________

(iii) පාදපරිචාරිකා ______________ (iv) අනතිමානී ______________

(v) ප්‍රදීප ස්තම්භය ______________ (vi) රුපුනොද ______________

(vii) අටසාළිස් ______________ (viii) ස්ථානෝචිත ප්‍රඥාව ______________

(ix) පුනරුදය ______________ (x) ප්‍රහර්ෂය ______________

(ලකුණු 1×10 = 10)

(06) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඇස්. මහින්ද හිමි විසින් රචිත දේශාභිමානී පද්‍ය කෘති දෙකක් නම් කරන්න.

1) ______________ 2) ______________

(ii) රබීන්ද්‍රනාත් තාගෝර් ලියන ලද නාට්‍ය කෘති දෙකක් දක්වන්න.

1) ______________ 2) ______________

(iii) භරතමුනි පඬිවරයාගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව ප්‍රධාන නාට්‍ය ශෛලීන් ද්විත්වය නම් කරන්න.

1) ______________ 2) ______________

(iv) ' මනමේ ' වේදිකා නාට්‍යයේ අඩංගු චරිත දෙකක් දක්වන්න.

1) ______________ 2) ______________

(v) කවියක කාව්‍යෝක්ති නැගීමට කවියා යොදාගන්නා කාව්‍ය උපක්‍රම දෙකක් ලියන්න.

1) ______________ 2) ______________

(ලකුණු 2 × 5 = 10)

(07) පහත සඳහන් ගද්‍ය, පද්‍ය පාඨවල දක්වෙන උපමාව සහ උපමේය වෙන් කර ලියන්න.

(i) "සුදෝ සුදු වැ වලාකුළෙනි - ඇයි මේ සිල් ගත්තා වැනි"

(ii) "සුර අඟනක විලසට - වේ ද වන සිඳගන"

(iii) පුංචි කිරිල්ල නැගූ නාදය සියල්ලන්ගේ ම දෙසවන්හි මී බිඳු හෙළන්නාක් මෙන් විය.

(iv) පතසන් අවරගිරි නැටියෙන් වැටෙන කල<br>විලිකුන් සුරත් පල වැනි වේ රිවි මඬල

(v) 'ළමයෙක් ඒ දෙසා - හැඬී බළලකු විලසා'

| | උපමාව | උපමේය |
|---|---|---|
| (i) | ______________ | ______________ |
| (ii) | ______________ | ______________ |
| (iii) | ______________ | ______________ |
| (iv) | ______________ | ______________ |
| (v) | ______________ | ______________ |

(ලකුණු 2 × 5 = 10)

(08) පහත සඳහන් සාහිත්‍ය නිර්මාණවල රචකයන් කවුරුන් ද යන්න දක්වන්න.

(i) කාබිලිවාලා ______________ (ii) මළගිය ඇත්තෝ ______________

(iii) ගුත්තිල කාව්‍ය ______________ (iv) ප්‍රබුද්ධ ______________

(v) හිම රජින ______________ (vi) කරුමක්කාරයෝ ______________

(vii) මං නැති දා ______________ (viii) හීන් සැරය ______________

(ix) පුංචි පැළේ ගස වෙනා ______________ (x) කාව්‍යශේඛරය ______________

(ලකුණු 1×10 = 10)

(09) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල අර්ථය ලිහිල් බසින් ලියන්න.

(i) ඉදින් තොපට දරු පෙමෙක් ඇත්නම් තපස් හානි නො සලකා මහණ ගොයම්හු කරා ගොසින් ඊට උපදෙස් විචාරව' යි කිවූ ය. උයිත් බුදුන් ළඟට ගොසින් බුදුන්ගෙනුත් කථාව එවා ගන්න පිණිස වැඳලා සිටියෝ ය. බුදුහු 'බොහෝ කලක් ජීවත් වව' යි වදාළ සේක.

(ii) දිසාවෙනැ යි මේ හිරු එන්නේ පායා
හැරී සිටී සූරියකත් ගසේ මල්
රුසුයි දිලෙන්නේ ලණුමෙන් ඇදීලා
මඟුල් ගෙයක් දෝ ලොව මේ වෙලාවේ.

(ලකුණු 5 × 2 = 10)

(10) පහත සඳහන් පැදිපෙළ කියවා එහි ඇතුළත් අදහස ගැන සැලකිල්ල යොමු කර, ඒ පිළිබඳ ව ඔබේ සිතට නැගෙන හැඟීම් **වචන 75 කින් පමණ** ලියන්න.

දණගාද්දි ඇවිදින්නට මට අත දුන්න
ගුරු හරුකම් හොඳ නොහොඳත් කියලා දුන්න
මහලුව බැරි වුණා ම ඔබ හට ඇවිදින්න
අත දෙන්නම් තාත්තේ වන්දි ගෙවන්න

ලෙඩක් දුකක් හැදුනාමත් ළඟම දුවටෙන
උකුල් තලේ උරේ තබා නටා නළවන
සුරංගනා කථා කියා කථා පවසන
අතත් හිතත් මොටද මගේ ඔබට නොවදින

වැල් ඇඟ උඩ වාඩිවෙලා රැවුල පැහෙන දා
මම තරුණෙකි කවදා හෝ එය ඉටුවෙන දා
දෙපා නැමද බුලත් අතින් තැගි ගෙනෙන දා
ඔබේ ඇසට කඳුළු නැගෙයි එදා නොවරදා

(ලකුණු 10)

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2024

(කලාප මට්ටමේ ලිඛිත තරග)

1. අපේක්ෂකයාගේ නම : ............................................................
   (මුල්'කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ............................................................
3. පාසල් වර්ගය (200 තෙක් / 201 - 500 තෙක් / 500 ට වැඩි) ..............................
4. කලාපය : ..............................
5. පළාත : ..............................

| **8 ශ්‍රේණිය** | **ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන** | **කාලය පැය 02** |
|---|---|---|

I කොටසින් **එකක් ද,** II කොටසේ (අ) යටතේ **එකක් ද,** (ආ) යටතේ **එකක් ද,** (ඉ) යටතේ **එකක් ද** වශයෙන් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

## I කොටස

- පහත දැක්වෙන මාතෘකාවලින් **එකක්** තෝරාගෙක වචන **250 - 300 අතර** වන සේ රචනයක් ලියන්න.

(අ) ස්වාභාවික වෘක්ෂලතා ස්වභාව ධර්මය අපට ලබාදුන් අමිල දයාදයකි. පාරිසරික සමතුලිතතාව ආරක්ෂා කරන වෘක්ෂලතාවන්ගෙන් සපිරුණු වනාන්තර වනසතුන්ගේ වාසස්ථානය ද වේ. එහෙත් වර්තමාන මිනිසාගේ අදූරදර්ශී ක්‍රියාවන් හේතුවෙන් වනාන්තර විනාශ වීමේ ප්‍රබල තර්ජනයකට මුහුණ පා ඇත. මේ පිළිබඳ අවධානය යොමු කරමින් **'තුරුලිය පිරි වන ගොමු මිහිමත ජීවයයි'** යන මැයෙන් රචනයක් ලියන්න.

(ආ) ළමයින්ගේ රස වින්දනය උදෙසා ලියවුණු ළමා සාහිත්‍ය කෘති බොහෝමයක් අප සතුව ඇත. ඒ ළමා සාහිත්‍ය පෝෂණය සඳහා කටයුතු කළ ලේඛකයන්ගෙන් අපට උරුම වූ සම්පතකි. ළමා සාහිත්‍ය කෘති මගින් ළමයින්ට සැලසෙන සෙත අතිමහත් ය. මේ පිළිබඳ අවධානය යොමු කර **'සිංහල ළමා සාහිත්‍ය කෘති'** යන මැයෙන් රචනයක් ලියන්න.

(ඇ) ළමා අවධියේ දී පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් කිරීම සමබර පෞරුෂ වර්ධනයට අත්‍යවශ්‍යම සාධකයකි. එහෙත් දුරකතන මගින් විවිධ ක්‍රීඩාවල යෙදී කාලය අපතේ හැරීමත්, එමගින් ප්‍රචණ්ඩත්වයට පෙළඹීමත් වර්තමානයේ ළමයින් අතර බහුලව දැකිය හැකි ය. මෙය ළමයින්ගේ කායික හා මානසික වර්ධනයට ද බොහෝ අහිතකර බලපෑම් එල්ල කරයි. මේ පිළිබඳ අවධානය යොමු කර **'විවේකය හා විනෝදාස්වාදය ඵලදායීව යොදා ගනිමු'** යන මැයෙන් රචනයක් ලියන්න.

(ඈ) බෞද්ධ, හින්දු, ඉස්ලාම්, කතෝලික ආදී කිසිදු ආගමකින් අන්‍යයන්ට හිංසා කිරීම අනුමත කර නැත. තමාටත් අනුන්ටත් අහිතකර ක්‍රියාවන් පිටු දැක ඇත. එහෙත් මේ තත්ත්වය වටහා නොගත් පටු ආකල්පවලින් යුත් ඇතමෙක් ආගම පදනම් කොට ගෙන ම යුද වදිති. මේ පිළිබඳ අවධානය යොමු කර **'ආගමික සහජීවනය තුළින් ලෝක සාමය ගොඩ නගමු'** යන මැයෙන් රචනයක් ලියන්න.

(ඉ) ජීවිතයට ඉතා වැදගත් ආදර්ශ සපයන කතා හා කාව්‍යවලින් සුලබ වූ ජනසාහිත්‍යයක් අපට උරුම වී ඇත. ඒවායෙහි ඇතුළත් විවිධ චරිත අදටත් අප සමාජයෙන් අත්දැක ඇත. හොඳ නොහොඳ තෝරා බේරා ජීවිත ආලෝකවත් කර ගැනීමට ජනසාහිත්‍ය මගින් මහගු පිටිවහලක් සැලසේ. මේ පිළිබඳ අවධානය යොමු කරමින් **'ජනසාහිත්‍යයෙන් ජීවිතය සාරවත් කර ගනිමු'** යන මැයෙන් රචනයක් ලියන්න. (ලකුණු 40)

## II කොටස

(අ) i. ඔබගේ පාසලේ වාර්ෂික ව පැවැත්වෙන කලා උලෙළ ලබන මස පැවැත්වීමට නියමිත ය. එහි ඔබ ඉදිරිපත් කරන නර්තන අංගය පිළිබඳව විස්තර කරමින්, එය නැරඹීමට පැමිණෙන ලෙස දන්වා ඇත ප්‍රදේශයක සිටින මිත්තනියට හෝ සීයාට යවන ලිපිය ලියන්න.

ii. අයහපත් ආහාර රටාවන් හා යහපත් සෞඛ්‍ය පුරුදු පිළිබඳ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට පහන්ගම විද්‍යාලෝක මහා විද්‍යාලයේ සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව තීරණය කර ඇත. ඔබ එහි ලේකම් යැයි සිතා එම වැඩසටහනේ දී සිසුන් සඳහා දේශනයක් පැවැත්වීමට ප්‍රජා වෛද්‍ය නිලධාරිවරයෙකු ලබාදෙන ලෙස ඉල්ලා ප්‍රදේශයේ රෝහල් අධිකාරිතුමාට යවන ලිපිය ලියන්න.

(ලකුණු 20)

(ආ) i. ඔබ ප්‍රදේශයේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ විදාතා සම්පත් මධ්‍යස්ථානය මගින් ස්වයං රැකියා බොහොමයක් සඳහා අවශ්‍ය දැනුම හා පසුබිම සකසා දෙයි. එහෙත් මේ පිළිබඳ ජනතාවගේ දැනුවත්භාවය අඩුබව පෙනීගොස් ඇත. විදාතා සම්පත් මධ්‍යස්ථානය මගින් සපයන සේවාවන් පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න.

ii. වෙසක් සතියට සමගාමීව ඔබ විද්‍යාලයේ සංවිධානය කරන ලද වැඩසටහන් බොහෝමයකි. ඒ පිළිබඳ තොරතුරු ඇතුළත් කරමින් පුවත්පතකට වාර්තාවක් ලියන්න.

(ලකුණු 20)

(ඉ) i. ජයෝදාපුර, ලුම්බිණි මහා විද්‍යාලයේ ශිෂ්‍ය නායක මණ්ඩලය සංවිධානය කරන වාර්ෂික ශිෂ්‍ය නායක කඳවුර සඳහා සහභාගි වන ලෙස ඉල්ලා අවට පාසල් වෙත යවන ආරාධනා පත්‍රය සකස් කරන්න. ඔබ විද්‍යාලයේ ප්‍රධාන ශිෂ්‍ය නායකයා/ නායිකාව යැයි සිතන්න.

ii. නාමල්තැන්න සුභූති මහා විද්‍යාලයේ පරිසර අලංකරණ කටයුතු සඳහා ආධාර පිණිස විද්‍යාලයීය පරිසර නියමු සංගමය විවේක කාලය තුළ දී පාසල් පොළක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. මේ පිළිබඳව පාසල් සිසුසිසුවියන් දැනුවත් කිරීමට සුදුසු පෝස්ටරයක් නිර්මාණය කරන්න.

(ලකුණු 20)

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2024
(කලාප මට්ටමේ ලිඛිත තරග)

1. අපේක්ෂකයාගේ නම : ............................................
(මුල්'කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ............................................
3. පාසල් වර්ගය (200 තෙක් / 201 - 500 තෙක් / 500 ට වැඩි) ............................................
4. කලාපය : ............................................
5. පළාත : ............................................

**9 ශ්‍රේණිය** | **සාහිත්‍ය දැනුම මිනුම** | **කාලය පැය 02යි**

සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

(01) පහත දැක්වෙන වගුව පෙළපොත ඇසුරෙන් සම්පූර්ණ කරන්න.

| ප්‍රකාශය | ප්‍රකාශය ඇතුළත් පාඩම | කවුරුන් විසින් කියන ලද්දක් ද? | කා හට කියන ලද්දක් ද? |
|---|---|---|---|
| ( i ) "මගේ කාරිය තනියම කරගන්ට මට පුළුවනි." | | | |
| (ii) "ඉදින් පළමු වයස දී ලොව් සැපත් හැර මහණ වූ නම් රහත් ව ලොවුතුරා සැපත් පුරා ලබන්නෝ ය." | | | |
| (iii) "මා එය දැනගෙන එන තුරු සතුටින් සිටිනු මැනව" | | | |
| (iv) "නැත්තන් තොට ගැලවෙන්නට විදියක් නෑ හම්බ වෙන්නෙ" | | | |
| (v) "අප්පොච්චිටත් ලුණු මිරිස් ටිකක් ඉතුරු කරලා කාපං" | | | |

(ලකුණු 3 × 5 = 15)

(02) පෙළපොතෙන් උපුටා ගෙන ඇති පහත සඳහන් පද්‍ය සම්පූර්ණ කරන්න.

1. සිත නිදහස් කරන හොඳම
ගුරු කම කව් මගට වැටුම
............................................
............................................

2.
............................................
............................................
ඉනුණා බසින දියරක් තැවරුණොත් මොබේ
මරණාසන්න හුස්මට මුත් ආසි ලැබේ

3. දුක්විඳ දසමස උසුලා වැදූදය අපෙ අම්මා

-----------------------------------------------

රට පලවැල නෙලා දිදී රස්සා කළ අම්මා

-----------------------------------------------

4. -----------------------------------------------

-----------------------------------------------

රුදු සත් සමුදුර පීනා

එතෙර කරන්නෙමි අම්මා

5. -----------------------------------------------

මහමෙර තුඹසෙකි කිඳෙලෙකි සමුදුර

-----------------------------------------------

සෙසු රජ නර පණුවන් කිම බැඳ වෙර

(ලකුණු 2 × 5 = 10)

(03) පහත සඳහන් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු තෝරන්න.

අ) 'දෑසේ නිල් පැහැය' පැදි පෙළ ඇතුළත් මුල් කෘතිය කුමක් ද?

(i) වෙරළ (ii) රන් තැටියක කඳුළු

(iii) සුභාෂිතය (iv) කවි දසුන

ආ) 'ශ්‍රී පාදය වැන්දවූ හැටි' ජනකතාව ඇතුළත් කෘතියේ රචකයා කවුරුන් ද?

(i) දයාසේන ගුණසිංහ (ii) මුනිදාස කුමාරතුංග

(iii) කේ.ඩී.පී.වික්‍රමසිංහ (iv) අරිසෙන් අහුබුදු

ඉ) 'කවිය නම් කිමෙක් ද' යන්න මැනවින් පහදා දීමට කුමාරතුංග මුනිදාසයන් විසින් රචිත කෘතියක් වන්නේ කුමක් ද?

(i) විරිත් වැකිය (ii) පියසමර

(iii) කුමර ගී (iv) ශික්ෂා මාර්ගය

ඊ) මධ්‍යකාලීන සිංහල කලා කෘතියේ රචකයා කවුරුන් ද?

(i) එස්.පණ්ඩිභාරත (ii) මුනිදාස කුමාරතුංග

(iii) ඒ.එච්.පියසේන (iv) ආනන්ද කුමාරස්වාමි

උ) 'සද්ධර්මරත්නාවලිය' ලියවුණු යුගය නම් කරන්න.

(i) පොළොන්නරු (ii) දඹදෙණි

(iii) කෝට්ටේ (iv) යාපහුව

(ලකුණු 2 × 5 = 10)

(04) පහත සඳහන් ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති කොටුව තුළ යොදන්න.

(i) ළමයෙකු ගැන ලියවුණු සිංහලයේ පැරණි ම පද්‍ය නිර්මාණයක් ඇතුළත් වන්නේ 'කාව්‍යශේඛරයේ' ය. ☐

(ii) 'හිතෝපදේශය' යනු සංස්කෘත උපදේශ සාහිත්‍ය කෘතියකි. ☐

(iii) බලා රස විඳින නාට්‍යය දෘශ්‍ය කාව්‍යයකි. ☐

(iv) 'දිට්ඨ දාන' කෙටිකතාව රචනා කළේ දයාසේන ගුණසිංහයන් විසිනි. ☐

(v) 'සද්ධර්මරත්නාවලිය' චිරන්තන සාහිත්‍ය ග්‍රන්ථයක් නොවේ. ☐

(ලකුණු 1 × 5 = 05)

(05) පහත දැක්වෙන පද්‍ය පාඨවල රචකයන් පහත දී ඇති පිළිතුරු අතරින් තෝරා ලියන්න.

(i) පියාසර කර ආමි දේශයෙන් දේශයට ------------------------------------

(ii) කරුණා මහිම කොයි තරම ද කිවොත් ඔබේ ------------------------------

(iii) විල් ජලයේ ගොහොරු මඩේ - සුදු රතු සියපත් පිපේ ---------------------

(iv) පුල හෙළ කුසුම ලිය පිය තෙපල රන් කෙඩි ---------------------------

(v) සමනොළ හිම කඳු මුදුනේ - සිරිපා සලකුණ ඇඳී ----------------------

(මහගමසේකර, එස්. මහින්ද හිමි, ශ්‍රී රාහුල හිමි, සුනිල් සරත් පෙරේරා, ඩබ්.ඒ.අබේසිංහ, පරාක්‍රම කොඩිතුවක්කු) (ලකුණු 2 × 5 = 10)

(06) පහත සඳහන් පදවල අර්ථය ලියන්න.

(i) එකුරුත්තේ ---------------------------- (ii) අකාරිය ----------------------------

(iii) වණික් ---------------------------- (iv) අනතිමාන ----------------------------

(v) විමෝචනය ---------------------------- (vi) පරිචය ----------------------------

(vii) ශක්‍යතාව ---------------------------- (viii) කුළු ගැන්වීම ----------------------------

(ix) චිරන්තන ---------------------------- (x) පෘථුල ----------------------------

(ලකුණු 1 × 10 = 10)

(07) පහත දැක්වෙන ගද්‍ය, පද්‍ය පාඨවල ඇති උපමාව සහ උපමේය වෙන් කර ලියන්න.

(i) පිදුරුතලාගල සේ උස් ප්‍රාර්ථනා සමනොළගල එකමුතුකම

(ii) උණ පඳුර දෙසින් ගීතයක් වැනි සිහින් හඬක් ඇසෙන්නට විය.

(iii) මගෙ නංගිගෙ පොඩි හිනාව වගේය මේ පිච්ච පොකුර

(iv) ගල් ගහන්නා වගේ වතුර කැට වැටෙනවා

(v) සෙල්ලම් පිටියක සාදන ලද මඩුවක් සේ කැලෑ රොද අපට බෙහෙවින් ප්‍රයෝජනවත් ය.

| | උපමාව | උපමේය |
|---|---|---|
| (i) | -------------------------------- | -------------------------------- |
| (ii) | -------------------------------- | -------------------------------- |
| (iii) | -------------------------------- | -------------------------------- |
| (iv) | -------------------------------- | -------------------------------- |
| (v) | -------------------------------- | -------------------------------- |

(ලකුණු 2 × 5 = 10)

(08) පිළිතුරු ලියන්න.

(i) 'නාට්‍ය ශාස්ත්‍රය' කෘතියේ රචකයා ------------------------------------ ය.

(ii) "ද කොකේසියන් චෝක් සර්කල්" නාට්‍යයේ සිංහලානුවාදනය වන්නේ ---------------- නාට්‍යයයි.

(iii) "වෙසක් පහන" ළමා කතාව ලිව්වේ ---------------------- විසිනි.

(iv) නූතන ළමා ගද්‍ය සාහිත්‍යයේ පුරෝගාමියා ලෙස සැලකෙන්නේ ------------------ ය.

(v) ළමයින් සඳහා වූ ප්‍රථම සිංහල මුද්‍රිත කෘතිය ලෙස සැලකෙන්නේ ---------------------- ලියූ හෝඩි පොතයි.

(ලකුණු 2× 5 = 10)

(09) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල අර්ථය ලිහිල් බසින් ලියන්න.

(i) "....... ඒ හැම විකොට කා නිමවාලා මාලු අවස්ථාවෙහි දී හිඳිනා ගෙයත් වික්කහ. ගෙය විකිණීව හැරගත්තවුන් ගෙයිත් හින්ද නොදී නෙරි හෙයින් ඇමෙණියන් කැඳවා ගෙන අනුන්ගේ බිතක්කනකට පලා ගොසින් රදා හිඳිනාහු කබල් කෙටි හැර ගෙන සිඟා ඇවිද බොහෝ දෙනා කා අන්තයේ ලූ බත් කන්ට පටන් ගත්හ. තමන් කොට පූ පරිත්‍යාග ලෙසට ම නිකෘෂ්ට ජීවිකා විය."

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

(ii) නැණ නැවින් සත් සයුරු තරණය කරන කවියනි, මගේ දූය සතු
පණ පොවා අදහසට පදයට ලොවක් පෙරළන තරමෙ බල ගතු
රණ විකුම් දක්වමින් යුද පෙරමුණට ජාතිය යැවිය හැකි මතු
ජන සිතුම්, ජන පැතුම්, ජන වේදනා ඔස්සේ කවි ලිවිය යුතු

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

(ලකුණු 5 × 2 = 10)

(10) පහත සඳහන් පැදිපෙළ කියවා එහි ඇතුළත් අදහස ගැන සැලකිල්ල යොමු කර ඒ, පිළිබඳ ව ඔබේ සිතට නැගෙන හැඟීම් **වචන 75 කින් පමණ** ලියන්න.

වමතින් බෙදයි දියවර වැව් පුරා ළන
එමගින් වැඩෙයි යායක කෙත් බිම් නිලන
සුරතින් බදයි පස් පියුමන් මුනි පුදන
දෝතින් පිසියි දැස ම දා සෙන සොයන

හිරු රැස වැදී නළියන වැව දිය ත ලය
රෑ සඳපාන ලැබ නිරතුරු නිස ස ලය
තාවුලු බිමේ වන සිවුපා හුරත ලය
කවි සිත් කිති කවයි සිතුවිලි කල බලය

(ලකුණු 10)

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සිංහල භාෂාව හා සාහිත්‍ය තරඟාවලිය - 2024
(කලාප මට්ටමේ ලිඛිත තරඟ)

1. අපේක්ෂකයාගේ නම : ..................................................
   (මුල'කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ..................................................
3. පාසල් වර්ගය (200 තෙක් / 201 - 500 තෙක් / 500 ට වැඩි) ..................................................
4. කලාපය : ..................................................
5. පළාත : ..................................................

| 10 ශ්‍රේණිය | සාහිත්‍ය දැනුම මිනුම | කාලය පැය 03 |
|---|---|---|

සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

(01) පහත දැක්වෙන ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අ. "එසේ වී නම් දෙව"

(i) මේ ප්‍රකාශය කළේ කවුරුන් ද?

..................................................

(ii) එම ප්‍රකාශය ශ්‍රවණය කළේ කවරෙක් ද?

..................................................

(iii) මෙම උද්ධෘතය උපුටාගත් ජාතක කථාව කුමක් ද?

..................................................

(iv) මේ ප්‍රකාශය හා සබැඳි අවස්ථාව ලියන්න.

..................................................

ආ.

අප බෝ සතුන් මිස
අනෙකකු නොම අසන ලෙස
සුර රජ සිට අහස
තතක් සිඳුවයි කීය එවිගස

(i) 'තතක් සිදුවයි' යන ප්‍රකාශය කළේ කවුරුන් ද?

..................................................

(ii) එම ප්‍රකාශය ඇසුණේ කාහට ද?

..................................................

(iii) මෙම පද්‍ය අයත් කෘතිය කුමක් ද?

..................................................

(iv) මෙම පද්‍යයෙන් කියවෙන අවස්ථාව ලියන්න.

..................................................

ඇ. "පුංචි මැණිකා මුවැත්තියක් වාගෙයි"

(i) මේ ප්‍රකාශය කළේ කවුරුන් ද?

..................................................

(ii) එම උද්ධෘතය උපුටාගත් ග්‍රන්ථයේ පරිවර්තකයා ලියන්න.

..................................................

(iii) පුංචි මැණිකාව මෙලෙස හැඳින්වූයේ ඇ සතුවූ කුමන ගුණාංගයක් නිසා ද?

..................................................

(iv) ගම්මු ඇගේ පියා හැඳින්වූයේ කෙසේ ද?

..................................................

ඈ. "නොකරන් එලෙස පියතුමගේ අණ ඉක්මවලා පුතුනේ නපුරැයි වන්නේ අප සැම දෙනටා නොකළොත් කී ලෙසිනා"

(i) මේ උද්ධෘතය අයත් පාඩමේ නම කුමක් ද?

-----------------------------------------------------------------------------------------------

(ii) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද?

-----------------------------------------------------------------------------------------------

(iii) නොකරන්නැයි පවසන්නේ කුමක් ද?

-----------------------------------------------------------------------------------------------

(iv) මෙහි සඳහන් වන පියතුමා කවුරුන් ද?

-----------------------------------------------------------------------------------------------

ඉ. "යාළුවා මාත් තල්ලු කරන්න උදව් වෙන්න ද?"

(i) මේ උද්ධෘතය ඇතුළත් පාඩමේ නම කුමක් ද?

-----------------------------------------------------------------------------------------------

(ii) මෙම නිර්මාණයේ මුල් නිර්මාණකරු කවුරුන් ද?

-----------------------------------------------------------------------------------------------

(iii) ඉහත උද්ධෘතයේ ප්‍රකාශකයා කවුරුන් ද?

-----------------------------------------------------------------------------------------------

(iv) ඔහුට ලැබුණු පිළිතුර ලියන්න.

-----------------------------------------------------------------------------------------------

(ලකුණු 4 × 5 = 20)

(02) පෙළපොත ඇසුරෙන් පහත දැක්වෙන පද්‍ය සම්පූර්ණ කරන්න.

(i) මිතුරු කමෙන් පෙරට එතොත්

-----------------------------------------------------------------------------------------------

මිතුරු වෙයන් පුතේ නුඹත්

-----------------------------------------------------------------------------------------------

(ii) මන මත් කරවන දන මුළු දෙරණා
රසවත් වන වේණා නද නද කරණා

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

(iii) සැඟවෙමි එබෙමි නිසසල වෙමි සසල වෙමි

-----------------------------------------------------------------------------------------------

කවදා කොතැනකදි හෝ මහ මුහුදු හිමි

-----------------------------------------------------------------------------------------------

(iv) නෙකවර පුතු විසිනා අසන ලද පැන නිසා

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

දෙදෙනා කැඳවා ගෙන කීවා තතු මෙලෙසා

(v) -----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

වෙර නැතිදා ගහගත්තේ දිනන්ට ද
යුධ ඇති දා නැති කග කොස් කොටන්ට ද

(ලකුණු 2 × 5 = 10)

(03) පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) 'බැද්දේගම' මෙන් ම වනගත පරිසරය පසුබිම් කරගත් වෙනත් නවකතාවක් නම් කරන්න.

---

(ii) එස්. මහින්ද හිමි පැවිදි ලැබූ නිකායන් දෙක ලියන්න.

---

(iii) එච්. එම්. කුඩලිගම කවියාගේ සමකාලීනයන් දෙදෙනෙක් නම් කරන්න.

---

(iv) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා ලියූ ස්වයං ලිඛිත චරිතාපදානය නම් කරන්න.

---

(v) මග අසබඩ කෙතක් රකිනා සිංහල කාන්තාවක ජාති, ජරා, මරණ පිළිබඳ සිංහල බසින් කී ගීයක් අසා සඟ සැට නමක් රහත් වූ බව දැක්වෙන කෘතිය කුමක් ද?

---

(vi) වායු ගණයෙන් තම කාව්‍ය ග්‍රන්ථය ආරම්භ කළ රචකයා කවුරුන් ද?

---

(vii) 'පන්සිය පනස් ජාතක පොත' සිංහලයට නැගීමේ කර්තව්‍යට අනුග්‍රහය ලබා දුන්නේ කවුරුන් ද?

---

(viii) නිර්මාණාත්මක සිංහල ලේඛන අතර පැරණිම ලේඛන හමුවන්නේ කවර ස්ථානයකින් ද?

---

(ix) 'කොකේසියන් චෝක් සර්කල්' නාට්‍යය රචකයා කුමන ජාතිකයෙක් ද?

---

(x) අසංග, නීලමනී යන චරිත ඇතුළත් නවකතාව නම් කරන්න.

---

(ලකුණු 1 × 10 = 10)

(04) පහත දැක්වෙන පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඔබගේ මව සහ මම එක් දවසක්
අවර'ඔරෙහි හිරු ගිලෙන පැයේ
හිඳගෙන හුන් විට පුලින තලාවක
ඈ විමසූවා වැතිර ළයේ
සැන්දෑවෙළපෙති පරයන තොල් ඇති
දූ මැණිකක් ඔබ රිසිද පියේ
ඈ කී වදනෙහි සැබෑව දක්නට
පෙර මගෙ නෙත් දෙක නැතිව ගියේ

මදුමල් පෙතිවල සිනිඳු මොළොක් බව
මවගේ අත්වල තිබුණි එදා
ඈ නැතිවූයේ ඒවා කැටි කොට
පොඩි දුවගේ අත් දෙකට පුදා
නා රොන් වැනි මුදු කෙහෙරැලි පීරා
සුවඳ අලෙවි දී දෙකට බෙදා
සරසන හැටි ඔබ දක්නට නොලැබී
ඇති වෙයි අඳ ඇස්වලට රුදා

ආලය උල්පත් දෙතැනක පිපිරී
මහ ගංගාවක් පරිදි සෙනේ
උතුරා යද්දී නැංවූ හේතුව නොදකී
ඇස් දෙක සිතට දූනේ
ඇයි මෙතරම් තෙත පොඩි කම්මුල්වල
සුරතල් දුව අඬනවද අනේ
ඔබගේ කඳුළැලි අත ගෑවෙන විට
ලේ තැවරෙන මෙන් අතට දැනේ

(i) මව කවියාගෙන් විමසුවේ කුමක් ද?

---

(ii) අඳ ඇස්වලට කඳුළු එන්නේ ඇයි?

---

(iii) මවගේ අත්වල ස්වභාවය කවියා දක්වා ඇත්තේ කෙසේ ද?

---

(iv) කවියාගේ සිතට දූනෙන දේ කුමක් ද?

---

(v) මෙම පද්‍ය පන්තියෙන් බිරිඳ මිය ගිය බව දැක්වෙන පද්‍ය පාදය උපුටා දක්වන්න.

---

(ලකුණු 1 × 5 = 5)

(05) පහත දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් හරි ලකුණ ද ( ✓ ) වැරදි නම් වැරදි ලකුණ ද ( ✗ ) ඉදිරියෙන් ඇති කොටුව තුළ යොදන්න.

(i) 'මං තනන්නෝ' කෙටිකතාව රචනා කරන ලද්දේ මහගම සේකරයන් විසිනි. ☐

(ii) එච්.එම්.කුඩලිගම සොබාදහම මහත් අභිරුචියෙන් වර්ණනා කළ කවියෙකි. ☐

(iii) 'පේමතෝ ජායතී සෝකෝ ' නාට්‍යයේ රචකයා ජයලත් මනෝරත්න මහතා ය. ☐

(iv) 'බලව් පොලොන්නරු අනුරාපුර පෙදෙස' යන ජාතිකාභිමානී පද්‍ය පන්තිය රචනා කළේ මොනිකා රුවන් පතිරණ කිවිඳියයි. ☐

(v) වැත්තෑවේ හිමියන් රචනා කළ 'ගුත්තිල කාව්‍යයට' වස්තු විෂය වූයේ ගුත්තිල ජාතකයයි. ☐

(vi) 'මේඝදූතය' මහා කවි කාලිදාසයන්ගේ කෘතියකි. ☐

(vii) 'වන්දිමි හිමි වලා තොගොසින් ඈ නිවෙස්නට' නැමැති සීගිරි ගීය ලියුවේ සිරිනාග නැමැත්තෙකි. ☐

(viii) 'පුරහඳ කළුවර' නවකතාව සුමිත්‍රා රාහුබද්ධගේ නිර්මාණයකි. ☐

(ix) අනුරාධපුර යුගයේ සාහිත්‍යකරණයට දායකත්වය ලබා දුන් රජ කෙනෙකි; හයවන පරාක්‍රමබාහු. ☐

(x) 'ගලන ගඟකි ජීවිතේ' ගීතය ගායනා කරන්නේ නන්දා මාලනී මහත්මියයි. ☐

(ලකුණු 1 × 10 = 10)

(06) පහත දැක්වෙන ගද්‍ය, පද්‍ය පාඨවල තද කළු අකුරෙන් දක්වා ඇති පදවල අදහස ලියා සමස්ත අදහස ලියන්න.

(i) "ඒ කේවට්ටාචාරී එක් දවසක් තුමූ අලුයම් වේලෙහි පිබිද , සුවඳ තෙලෙහි නගන ලද පහන් ආලෝකයෙන් **ගන්ධදාම** පුෂ්පදාමාවලම්බිත නා නා වර්ණ විචිත්‍ර **විතානෝපලක්ෂිත** අලංකෘත ශ්‍රී යහන් ගර්භය බලන්නාහු මහත් වූ සම්පත් දැක ..."

ගන්ධදාම ------------------------------------------------------------

විතානෝපලක්ෂිත ------------------------------------------------------------

------------------------------------------------------------

------------------------------------------------------------

------------------------------------------------------------

------------------------------------------------------------

------------------------------------------------------------

(ii) තුමුල ගතින් දා
බාහු බෙලෙන් දා
වෙමි සේ **තිදසින් දා**
කුරිරු ගිජින් දා
කුඹු තල සින්දා
ලමි සේ කෙසරින් දා
මා පිය **මිඟිදා** කරනා විකුමන්
ඇයි මට බැරි වන්නේ

තිදසින් දා ------------------------------------------------------------

මිඟිදා ------------------------------------------------------------

------------------------------------------------------------

------------------------------------------------------------

------------------------------------------------------------

------------------------------------------------------------

------------------------------------------------------------

(ලකුණු 5 × 2 = 10)

(07) පහත දැක්වෙන පාඨවල උපමාව උපමේය වෙන්කොට ලියන්න.

(i) මද සන්සුන් පියොවින් සිටි නොසැලී
ගජසෙන් සිතියම් ගජ සිරි කියැලී

(ii) ගැල්පුරා ගෙනවුත් කොමඩු බාන්නා සේ මියුළු නුවර වාසීන්ගේ හිස් කපාගෙන

(iii) පින් පිඬ වැනි මා මැණිය කියනු නොවළහා

(iv) සඳ කැලුම් නිසා සීතාවක සඳ ලොවින් ගෙනා සඳ කඩක් මෙන් රිදී පැහැයෙන් බබළන්නට විය.

(v) 'දෙව් රජවරුන් වැනි මහ රජවරුන් රැඳී'

| | උපමාව | උපමේය |
|---|---|---|
| (i) | ------------------------ | ------------------------ |
| (ii) | ------------------------ | ------------------------ |
| (iii) | ------------------------ | ------------------------ |
| (iv) | ------------------------ | ------------------------ |
| (v) | ------------------------ | ------------------------ |

(ලකුණු 1 × 5 = 5)

(08) පහත දැක්වෙන කාව්‍ය නිර්මාණය කියවා එහි ඇතුළත් සමස්ත අදහස ගැන සැලකිල්ලට යොමු කර ඒ පිළිබඳව ඔබේ සිතට නැගෙන හැඟීම් **වචන 100 කින් පමණ** ලියන්න.

පසුගිය නත්තල් කාලේ නිවාඩුවෙයි මම ආවේ
පුංචි බේබි එක්කල පාසල් යන්නයි මෙහි ආවේ

හතේ අටේ චක්කරයෙන් ගණන් හදා සමත් වෙලා
පොතේ තියෙන කතා කියා පාඩම් දී සමත් වෙලා

ලේනා ගැන පූසා ගැන කවි කියලා සමත් වෙලා
ගමේ ඉඳන් ආවේ මම දෙකෙන් තුනට සමත් වෙලා

බේබිගෙ අත අල්ලාගෙන උදේට පාසල් යනවා
බේබිගෙ අත අල්ලාගෙන සවසට ගෙදරට එනවා

බේබිගෙ පන්තිය අයිනේ ගල් බැම්මේ වාඩි වෙන්නෙ
බේබිලාට කියන කතා එතන ඉඳන් අහන් ඉන්නේ

හවසට අත්වැල් බැඳගෙන කවි කියන්නෙ අපි දෙන්නා
ගැමුණු කුමරුගේ කතාව ඉගෙන ගන්නෙ අපි දෙන්නා

එහෙම වුණත් මං නොදන්න දෙයක් තියනවා අහන්න
දන්න කෙනෙක් හොයා බලා මට මේ ගැන කියා දෙන්න

තුනේ ඉඳපු පුංචි බේබි හතරේ පංතියට ගිහින්
තුනේ ඉඳපු මං හතරට යන්නේ කවදාද ඉතින්

(ලකුණු 10)

(09) 'ගංගාවේ සංගීතය' පද්‍ය පන්තියේ රසාලිප්ත බව සඳහා කවියා යොදාගෙන ඇති කාව්‍යෝක්ති පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 10)

(10) මිනිස් ජීවිතවලට වඩා අගරජකම හා අග්‍ර පුරෝහිතකම ළඟා කර ගැනීමට චූලනී බ්‍රහ්මදත්ත කේවට්ට සුසංයෝගය ක්‍රියා කළ අයුරු උදාහරණ **තුනක්** මඟින් පහදා දෙන්න. (ලකුණු 10)

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2024**
**(කලාප මට්ටමේ ලිඛිත තරග)**

1. අපේක්ෂකයාගේ නම : ..............................................................
   (මුල'කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ..............................................................
3. පාසල් වර්ගය (200 තෙක් / 201 - 500 තෙක් / 500 ට වැඩි)..............................
4. කලාපය : ..............................
5. පළාත : ..............................

**11 ශ්‍රේණිය** **සාහිත්‍ය දැනුම මිනුම** **කාලය පැය 03 යි.**

සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

(01) පහත දැක්වෙන පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අ. "මට වඩා හොඳින් ඔය ගැන දන්න කෙනෙක් තවත් මෙහෙ නෑ."

(i) මේ ප්‍රකාශය කළේ කවුරුන් ද?
..............................................................

(ii) එම ප්‍රකාශය ශ්‍රවණය කළේ කවුරුන් විසින් ද?
..............................................................

(iii) "ඔය ගැන"යන්නෙන් අදහස් වූයේ කුමක් ද?
..............................................................

(iv) මෙම උද්ධෘතය උපුටා ගත් කෘතිය කුමක් ද?
..............................................................

ආ. "තොප නිසා අවුත් මෙතෙක් කල් මෙතැන වසන අපට තෙපි අමුතු පඬුරක් පමණ වත් නොඑවූ විරූ ය."

(i) මෙහි "අපට " යනු කාහට ද?
..............................................................

(ii) "තොප" යනුවෙන් ඇමතුම් ලැබුවේ කවුරුන් ද?
..............................................................

(iii) මෙම ප්‍රකාශය ඇතුළත් කෘතිය රචිත යුගයේ පාලකයාව සිටි රජු කවුද?
..............................................................

(iv) ඒ කිනම් සියවසෙහි ද?
..............................................................

ඇ. "මෙ මහාමායා දෙවිය පුතු සිද්ධත් මහණරජහු ගෙ ගර්ජනා යැ."

(i) මෙසේ සිතුවේ කවුද?
..............................................................

(ii) කිනම් අවස්ථාවක දී ද?
..............................................................

(iii) මෙම. ප්‍රකාශය ඇතුළත් මුල් කෘතිය ලියන්න.
..............................................................

(iv) එහි රචකයා ලියූ වෙනත් කෘතියකි. එය නම් කරන්න.
..............................................................

ඈ. "එහෙම දෙයක් ගැන අහලවත් නැතිව ඇති මගෙ හිතේ."

(i) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද?

---

(ii) "එහෙම දෙයක්" යන්නෙන් අදහස් කළේ කුමක් ද?

---

(iii) මෙම උද්ධෘතය උපුටා ගත් කෘතියේ කතුවරයා නම් කරන්න.

---

(iv) එතුමා විසින් රචිත මුල් ම කෙටිකතා සංග්‍රහයේ නම කුමක් ද?

---

ඉ. "ඇවැත්නි, සැට රියන් හුණ දණ්ඩෙන් බස්නා ගමනේ භයෙක් නොවී ද?"

(i) මෙසේ විචාළේ කවුරුන් විසින් ද?

---

(ii) "අවැත්නි" යනුවෙන් ඇමතුවේ කවුරුන්ව ද?

---

(iii) මෙම ප්‍රකාශය ඇතුළත් කෘතිය සඳහා මූලාශ්‍රය වූ කෘතිය කුමක් ද?

---

(iv) එහි රචකයාගේ නම ලියන්න.

---

(ලකුණු 4 × 5 = 20)

(02) පහත දැක්වෙන පද්‍ය සම්පූර්ණ කරන්න.

(i)

---

---

ගොල්ල සමග එති ඌරෝ සැමදාම
නිල්ල අඹති සත් දවසින් බැලුවාම

(ii)

දිමුතු යසස් වන් කුසුම සරාගේ

---

---

උමතු නොවෙද කෙලෙසක සිත කාගේ

(iii)

දුටු සත සිතට තුටු වන ලෙසට නිතියෙනි
සතර'ත එකට සම කර බෙර ඇසක් මෙනි

---

---

(iv)

මිනිසුන් ඉවුරුවල යන එන අඩි සද්දෙන්

---

කෙකටිය ඕලු නළියන දිය රැලි මැද්දෙන්

---

(v)

මග නිලමින් සිටි නා දොඹ නී පියල

---

---

ඉසිඹුලමින් යෙහි සැළ දඹ පඳුරුවල

(ලකුණු 2 × 5 = 10)

(03) පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) 'සද්ධර්මරත්නාවලියෙන්' උපුටා ගත් පෙළපොතෙහි ඇතුළත් පාඩමේ නම ලියන්න.

---

(ii) 'ලෝවැඩ සඟරාව', 'බුදුගුණ අලංකාරය' යන කෘතිවල රචකයා කවරෙක් ද?

---

(iii) ජාතක කථා ඇසුරෙන් රචිත මහා කාව්‍යයක් නම් කරන්න.

---

(iv) ගුත්තිල කාව්‍යය ආරම්භ වන වායු ගණයේ ලඝු, ගුරු අක්ෂර නියමය දක්වන්න.

---

(v) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචිත ස්වයං ලිඛිත චරිතාපදානය නම් කරන්න.

---

(vi) 'කාව්‍යාදර්ශ' නම් අලංකාර ග්‍රන්ථයේ අනුවාදයක් ලෙසින් රචිත කෘතිය නම් කරන්න.

---

(vii) 'එකෝමත් එක රටක' කාව්‍ය ග්‍රන්ථයේ රචකයාගේ නම ලියන්න.

---

(viii) මාර්ටින් වික්‍රමසිංහයන් විසින් රචනා කරන ලද තුන් ඈඳුතු නවකතාවලින් එකක් සඳහන් කරන්න.

---

(ix) 'සඳා මෙලෙස පුර දෙරණේ' නවකතාවේ රචකයා කවුරුන් ද?

---

(x) දෙවියන් උදෙසා පුද පූජා පැවැත්වීමේ දී ගැයුණු කවි ගායනා වර්ගයක් ලියන්න.

---

(ලකුණු 1 × 10 = 10)

(04) පහත සඳහන් උපුටනවල ඇති සාහිත්‍යමය ව්‍යවහාරය **වඩාත්** ඉස්මතු වන වරණය වරහන් තුළින් තෝරා ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.
(උපමාලංකාරය/ අනුප්‍රාසය/ අතිශයෝක්තිය/ එළිසමය/ ස්වභාවෝක්තිය/ රූපකාලංකාරය)

(i) රිවි තැවුලේ පිපි කමලේ විල් ගැවසී
මත කොවුලේ තුරු වදලේ හඬන රිසී ---------------------------

(ii) මෙනරම්බා හිමි රූ සිරිනි මනහර
පැරකුම්බා නරනිඳු සඳ දකු මිතුර ---------------------------

(iii) නල බල සසල දළ රළ පෙළ නුබ නැගෙන ---------------------------

(iv) මී දේ දුව ඉසට නැගුව - ඉඳු නිල්මිණි සේසතක් ය. ---------------------------

(v) කම් පසේ දෙන සැර ලෙසේ දෙස
බල බලා නෙතඟින් සබා ---------------------------

(ලකුණු 1 × 5 = 5)

(05) පහත දැක්වෙන පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දෙපයින් පොළොවේ සිටගත් දා සිට
පණ නැති වී ඇද වැටෙන තුරා -
පැල්පත් මාලිග මන්දිර අත හැර
ඇළ දොළ ගංගා සාගර පසු කර
දිවූ නමුත් එකෙකා පසු බා ගෙන
දිනූ කෙනෙක් මට තව හමු වී නැත
ඇට වූ මලපුඩුවෙහි පිළිමල් දන
පැටලී බිම ඇද වැටෙන තුරා
දිවූ නමුත් උන් ඊට උඩින් පැන
දිනූ දෙයක් නැත හති වැටුණා මිස
අහස පොළොව අර ගැට ගැසෙනා තැන
සිතින් මවාගත් ජය කණුවක් ඇත
දිව යන තරමට දිව යන්නේ එය

(i) මෙම පැදියෙන් ඉස්මතු කොට දැක්වීමට උත්සාහ ගන්නේ මිනිස් සන්තානයේ පවත්නා කිනම් ලක්ෂණයක් ද?

---

(ii) තරගයෙන් ලද ප්‍රතිලාභ මොනවා ද?

---

(iii) සිතින් මවාගත් ජය කණුව ඇත්තේ කිනම් ස්ථානයක ද?

---

(iv) 'දිව යන තරමට දිව යන්නේ එය' යන්නෙහි අර්ථය ලියන්න.

---

(v) පහත වචනවල අර්ථය ලියා දක්වන්න.

1) මලපුඩුවෙහි ..............................
2) පිළිමල් ..............................

(ලකුණු 2 × 5 = 10)

(06) පහත දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් හරි ලකුණ ද ( ✓ ) වැරදි නම් වැරදි ලකුණ ද ( ✗ ) ඉදිරියෙන් ඇති කොටුව තුළ යොදන්න.

(i) 'ධීවරී ගීතය' පද්‍ය පන්තිය මහගම සේකරයන්ගේ නිර්මාණයකි. ☐
(ii) ගුරුළුගෝමීන් විසින් රචිත කෘතියකි 'බුත්සරණ' ☐
(iii) 'සාහිත්‍ය විද්‍යාව' ජී.බී. සේනානායකගේ විචාර කෘතියකි. ☐
(iv) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර 'බූන්කා' සම්මානයෙන් පිදුම් ලැබී ය. ☐
(v) 'දියමන්ති මාලය' කෙටිකතාවේ මුල්කෘතිය ගී ද මෝපසාං විසින් රචනා කරන ලද්දකි. ☐
(vi) කේ. ජයතිලක ලියූ නවකතාවකි, 'චරිත තුනක්' ☐
(vii) 'සැවුල් සන්දේශය' තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචනා කරන ලද්දකි. ☐
(viii) 'කුණාටුව' පද්‍ය සංග්‍රහය මීමන ප්‍රේමතිලකගේ නිර්මාණයකි. ☐
(ix) 'වෙස්සන්තර ජාතක කාව්‍යය' කෝට්ටේ සාහිත්‍ය අවධියේ රචනා විය. ☐
(x) 'පෙර රජ දවස ලංකාව' පද්‍ය පන්තිය එස්. මහින්ද හිමියන්ගේ නිර්මාණයකි. ☐

(ලකුණු 1 × 10 = 10)

(07) පහත දී ඇති සාහිත්‍යය හා සම්බන්ධ වචන කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) පරිකල්පනය ------------------------------------------------------------

------------------------------------------------------------

(ii) භාවික ගුණය ------------------------------------------------------------

------------------------------------------------------------

(iii) ප්‍රතිභාව ------------------------------------------------------------

------------------------------------------------------------

(iv) සංකල්ප රූප ------------------------------------------------------------

------------------------------------------------------------

(v) සහෘදයා ------------------------------------------------------------

------------------------------------------------------------

(ලකුණු 1 × 5 = 5)

(08) පහත දැක්වෙන ගීතය කියවා එහි ඇතුළත් සමස්ත අදහස ගැන සැලකිල්ල යොමු කර, ඒ පිළිබඳව ඔබගේ සිතට නැගෙන හැඟීම් **වචන 100 කින් පමණ** ලියන්න.

උතුරු සළු හැඳ පොරවාලා
උතුරු දම් හද තවරාලා
පතුරනා මුදිතා සිනා
මිතුරියේ ඔබ දුටුවෙමි

සරණ සිල්ගෙන අරණ තුළ හුන්
උවැසියන් මැද්දේ
ගුවන තරු පිරිවැරුණ සඳ සේ
සිටි පබාවතියේ

වීතරාගී හදවතකි ඇස
නැත සරාගී රස විඳින්නේ
දැත සංවර ලෙස තබන්
මා වෙතින් සෙමින් පියවර නගන්නේ

නුමුමුණන්නෙමි වදනකුදු මම
ඔබට ඇති අපමණ දයාවෙන්
ඉවත්වන්නෙමි වෙහෙර බිම ඇති
නොකිළිටි වූ සුදු වැලි තලාවෙන්

(ලකුණු 10)

(09) තත්කාලීන සමාජයේ පැවති සමාජ ආර්ථික හා ඓතිහාසික තොරතුරු ප්‍රතිභා සම්පන්න කවියෙකු අතින් - රසවත් ලෙස ඉදිරිපත් වී ඇති ආකාරය මග විසිතුරු පද්‍ය පන්තිය ඇසුරෙන් විමසන්න.
(ලකුණු 10)

(10) 'අභියෝග හමුවේ ධෛර්යවන්තව කටයුතු කිරීම හා ඉවසිලිවන්ත බව උග්ගසේන සිටුපුතුගේ චරිතයෙන් මනාව ඉස්මතු වේ.' නිර්දිෂ්ට කථාවෙන් උදාහරණ දක්වමින් විමසීමක යෙදෙන්න.
(ලකුණු 10)

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2024**
**(කලාප මට්ටමේ ලිඛිත තරග)**

1. අපේක්ෂකයාගේ නම : ........................................
(මුල්කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ........................................
3. පාසල් වර්ගය (200 තෙක් / 201 - 500 තෙක් / 500 ට වැඩි) ........................................
4. කලාපය : ........................................
5. පළාත : ........................................

**12/13 ශ්‍රේණි** | **සාහිත්‍ය දැනුම මිනුම** | **කාලය පැය 03**

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(01) නිර්දිෂ්ට ග්‍රන්ථවල අන්තර්ගත පහත දැක්වෙන උද්ධෘත පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(අ)
රගත් සුරා පිරූ විතින්
සුරත් තඹුරු පෙතිසෙ නෙතින්
පුවත් නොදන බමන ගතින්
නටත් අයෙක් සුරා මතින්

i. මෙහි සඳහන් උපමාව සහ උපමේය ලියන්න.

........................................

ii. මේ කවියෙන් මතුවන රසය කුමක් ද?

........................................

(ලකුණු 2 × 2 = 4)

(ආ) තුමූ සිටිපස්වලා එක් අතකින් බොටුව අල්වාගෙන එක අතෙකින් පිටිමුල අල්වාගෙන ඌගේ කායබල තරමට තමන්ගේ ඥානාකෘති වූ මායා බලය මහත් හෙයින් ගල් මුදුනෙන් දැමූව.

i. මෙහි 'තුමූ' යනුවෙන් හඳුන්වන්නේ කවුරුන් ද?

........................................

ii. ඥානාකෘති වූ, මායා බලය යන්නෙහි අර්ථ ලියන්න.

........................................

(ලකුණු 2 × 2 = 4)

(ඉ) උද්දාල බ්‍රහ්මණයා ඉතා ආශ්චර්යවත් ව කවර ආලෝකයක් දෝ හෝ යි විස්මය පත්ව බලනුයේ ස්වර්ණතිලකාව දැක කාමයෙන් උමතුව මහත් වූ ශෝකයෙන් දාහගත් ශරීර ඇති ව හුණු වූ ආශ්වාස ප්‍රශ්වාසයෙන් පිරුණු නාසිකා හා කඳුළු ධාරවෙන් තෙත් වූ නේත්‍ර ඇති ව විසංඥ විය.

i. ස්වර්ණතිලකාව දුටු උද්දාල බ්‍රහ්මණයාට සිදුවූයේ කුමක් ද?

........................................

ii. විසංඥ යන්නට කෙටි විවරණ සපයන්න.

........................................

(ලකුණු 2 × 2 = 4)

(ඊ) තෝ ශෝක නොකරව. ඉදින් තෝ කැමැත්තෙහි වී නම් මට බිරින්දෑකොට සොළොස් දහසක් පුරංගනාවන් මාධ්‍යයෙහි රජ කුලයෙහි ප්‍රසිද්ධව" යි කීහ. එපවත් අසා චන්ද්‍රිකා තොම අවලක්ෂණ තෝ මා නිසා නිරපරාධ වූ මගේ සමණා මැරී ද? ඔහු කෙරෙහි ස්නේහයෙන් හඬා මියෙන පමණ මුත් තොපට පාද පරිචාරිකාවීමෙක් ඒකාන්තයෙන් නොවෙයි තද කොට කිව.

i. කිඳුරංගනාව හඬන විට රජු ඇය අස්වැසුවේ කෙසේ ද?

.......................................................................................................................

ii. රජුගේ ප්‍රකාශයට චන්ද්‍රිකා තොමෝ දුන් පිළිතුර කුමක් ද?

.......................................................................................................................

(ලකුණු 2 × 2 = 4)

(උ) 'ඇසිල්ලකින් සන්සිඳුවා ලමි' යි 'පතක් පමණ ගිතෙල් උව මැනවැයි' කියා ගෙන්වා ගෙණ තමන් අතින් නො එක් ඖෂධ ලා තෙල් සිඳ නිවා නශ්‍ය කළහ. තෙල ඉසට උරාගැන්ම හා සමග තෙලින් භාගයක් ඉසට නැංග භාගයක් මූබයට බට. මූබයට බට තෙල් බිමට දමා කෙල්ලනි, තෙල තෙල් පුලුනෙන් ඉඳ රැක තබව යි කියා තෙල් ඉඳුවා තැබ්බුහ.

i. උක්ත පාඨය ඇතුළත් මුල් කෘතිය කුමක් ද?

.......................................................................................................................

ii. ඉහත උද්ධෘතය ඇතුළත් කතාවේ එන සිටු දේවියගේ චරිතයෙන් කියැවෙන අරපිරිමැස්ම පිළිබඳ ප්‍රකාශය ලියන්න.

.......................................................................................................................

(ලකුණු 2 × 2 = 4)

(02) පහත දැක්වෙන පාඨවල අවස්ථා සම්බන්ධය ලියන්න.

i. ''තොපගේ පුතණුවන්ගේ සැටි පෙවෙත් නපුර උන් තමන් නොකියතත් ලෙඩක් ඇත්තා සෙ. ඊට නිසි පිළියම් දන්නා කෙනෙක් ගෙනවුත් පිළියම් කරවයි.''

.......................................................................................................................

.......................................................................................................................

ii. ''එපරිද්දෙන් ම පුරුෂයන් නැතිව තනිව ඉන්නා කල ස්ත්‍රීන්ට නොහෙබනේ ය.''

.......................................................................................................................

.......................................................................................................................

iii. 'ශාස්ත්‍රය නම් බාලය වැඩි මහලු ය යන බැවහර නැත්තේ ය.'

.......................................................................................................................

.......................................................................................................................

iv. ''තොප ගේ පරණ සමණන්ට කළ දෑ දුටු කල මට තමා වේද තීගෙන් මම ප්‍රයෝජන නැත''

.......................................................................................................................

.......................................................................................................................

v. 'තෙල නැති ම පුතනුවන්ට දෙව'

.......................................................................................................................

.......................................................................................................................

(ලකුණු 2 × 5 = 10)

(03) පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. 'වරදත්ත' කෘතියේ කතුවරයා නම් කරන්න.

........................................................................................................................

ii. එරික් ඉලයප්පෙරුම ආරච්චිගේ ප්‍රථම කෙටිකතා සංග්‍රහය කුමක් ද?

........................................................................................................................

iii. දෘශ්‍ය කාව්‍ය පිළිබඳ ලියැවුන 'නාට්‍ය ශාස්ත්‍රය' කෘතියේ කතුවරයා කවුරුන් ද?

........................................................................................................................

iv. ප්‍රහේලිකා කාව්‍ය ගණයට අයත් විදාගම මාහිමියන් ලියූ කෘතිය නම් කරන්න.

........................................................................................................................

v. 2023 වර්ෂයේ රාජ්‍ය සම්මාන ලැබූ නවකතාව කුමක් ද?

........................................................................................................................

(ලකුණු 1 × 5 = 5)

(04) පහත දැක්වෙන පද්‍ය සම්පූර්ණ කරන්න.

i. ..........................................................................................................

..........................................................................................................

ඒත් අම්මේ දවස ගෙවිල තිදි පැදුරේ ඇල වුණාම

තවමත් සිහිනෙන් උඹ මට කියන්නේ පොඩි දුවේ කියල

ii. ..........................................................................................................

ඔබේ රථ මැදිරියට මගේ ඉර හඳ අරන්

..........................................................................................................

කමක් නෑ ඔබ යන්න මගේ ආයුෂ අරන්

iii. ..........................................................................................................

පැරණි තරහ හැම යට ලන්නී

ආයෙත් එකමුතු කරවන්නී

..........................................................................................................

iv. සෙවණැලි නිදාගති ගමවට කළ බැද්දේ

උණබට තරගයට මෙන් එකටෙක මැද්දේ

..........................................................................................................

..........................................................................................................

v. තම තුනු කැලුම් සිහිලෙන් නැහැවෙවී වරෙන්

..........................................................................................................

..........................................................................................................

සමනොල පුෂ්ප රාගය මා ළඟට වරෙන්

(ලකුණු 2 × 5 = 10)

(05) පහත දැක්වෙන පද්‍ය කොටස් උපුටාගත් කෘතිය සහ කතුවරයාගේ නම හිස්තැනෙහි ලියන්න.

i. කෙනෙකන ගී නගිමිනි පෙඳ නගමිනි නැවෙත් ..............................
පියවුරු ළඟාය වුවන් සමඟාය තෙපියුම් වන් ..............................

ii. මගෙ කුකුළා නැසූ එකා
දදය ඔබගෙ පාළු යකා
තව එක බුද දිනක් තකා ..............................
ඉන්නට ඉඩ නොදී මකා ..............................

iii. වතින් සොමි සඳ වු
තෙනෙන් රන් පෙඳ වු
රන්ලිය සිරින් බඳ වු ..............................
දියණියන් තම ළඟට කැඳ වු ..............................

iv. වැහි පොද එකිනෙක වැටෙනව බලාපන්කො
පොළොව උඩට ..............................
පොළොව ලොවිනවා වැහිපොද දිව ..............................
දික්කරලා හනිකට

v. වැහි වලාකුළ පෑ කළු යයි ඔබේ
නො හොබිති යි කිසි ලෙස් නො සතොස් නොවන්
සිරුර පැයෙනු, ගත් සුදනෝ ලොවේ ..............................
නො හඳුනත් උතුමන් ගුණයෙන් විනා ..............................

vi. බකමුණෝ පියාඹති
අතිත් කුරුල්ලෝ නිදති
බෝ අතුවල එල්ලීගෙන ..............................
මා වවුලෝ කැගසති ..............................

vii. රහසත් පව්නොකොට
කෙලෙසරයනුත් දුරුකොට
නිසිවුයෙන් පුදට ..............................
අරහ යන නම කියති මුනිඳුට ..............................

viii. නුවණැත්තවුන් පහ කොට දුදනන් සෙවුන
නොගත් සිත තුළෙහි ගුණ පොකුරඹ ලෙසින
මැදහත් නොව මසුරු ගුණයෙන් දවසරින ..............................
රජුටත් එරටටත් අතුරක් නැත පවතින ..............................

(ලකුණු 1 × 8 = 8)